# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
## 2009 අගෝස්තු

**දේශපාලන විද්‍යාවේ මූලිකාංග - I** | **පැය තුනයි**

අයදුම්කරුවන්ට උපදෙස්:
* I කොටසේ බහුවරණ ප්‍රශ්න 40ක් ඇත.
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. එක් නිවැරදි පිළිතුරකට ලකුණු එක බැගින් හිමි වේ.
* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා, එය II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දිය යුතු ය.
* එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.
* පිළිතුරු ලකුණු කිරීම සඳහා පැන්සල් භාවිත කිරීම තහනම් වේ.

## I කොටස

● අංක 1 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් එක් ප්‍රකාශයක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ නොවේ. වැරදි ප්‍රකාශය තෝරන්න.

1. දේශපාලනය
   (1) දේශපාලන ක්‍රමයක් තුළ තරඟකාරී රඟුම්කරුවන් අතර සිදුවන ක්‍රියාවකි.
   (2) අරමුණු හා ක්‍රියාමාර්ග අතර වූ තරඟකාරී තත්ත්වයක් තුළ වුවද දැකිය හැක.
   (3) අරගලයක ස්වරූපයෙන් ක්‍රියාවට නැංවේ.
   (4) රඟුම්කරුවන්ගේ අරමුණු සපුරා ගැනීම ඉලක්කය වේ. (............)

2. දේශපාලන විද්‍යාව සලකා බලන මූලික කරුණු වන්නේ
   (1) මානවයන්ගේ සදාචාරාත්මක ජීවිතය ඉහළ නැංවීමයි.
   (2) රාජ්‍යයේ ආරම්භය, වර්ධනය හා ස්වභාවයයි.
   (3) දේශපාලනයට අදාළ න්‍යායන් නිගමනය කිරීමයි.
   (4) යහපත් ආණ්ඩුවක ස්වභාවය සහ ආකෘතිය කුමක් ද යන්නයි. (............)

3. දේශපාලනය ඉගෙන ගැනීම අවශ්‍ය වන්නේ
   (1) දේශපාලන ක්‍රීඩාවේ ස්වභාවය තේරුම් ගැනීමටයි.
   (2) සක්‍රිය සහ අර්ථවත් දේශපාලන ජීවියෙකු වීමටයි.
   (3) දේශපාලනයේ සදාචාර මූලධර්ම ඉගෙනීමටයි.
   (4) යහපත් පුරවැසි ගුණාංග වර්ධනය කර ගැනීමටයි. (............)

4. දේශපාලනය අධ්‍යයනය කිරීමේ දාර්ශනික ප්‍රවේශය
   (1) ප්‍රත්‍යක්ෂමූලකවාදය මත ගොඩනැගී ඇත.
   (2) අභි උපගමන මත ගොඩනැගී ඇත.
   (3) ගැටලු සඳහා පරමාදර්ශී විසඳුම් සොයනු ලැබේ.
   (4) යථාර්ථයෙන් ඈත්වූවක් වේ. (............)

5. දේශපාලනය අධ්‍යයනය කිරීමේ චර්යාවාදී ප්‍රවේශය
   (1) ප්‍රත්‍යක්ෂමූලක අධ්‍යයන පමණක් අවධාරණය කරයි.
   (2) හේතු සාධක හා අගයකිරීම් අතර බණ්ධනය අවධාරණය කරයි.
   (3) පරමාදර්ශ මත රඳා පවතියි.
   (4) සදාචාරය සහ දේශපාලනය අතර සම්බන්ධතාව ප්‍රතික්ෂේප කරයි. (............)

6. රාජ්‍යය
   (1) අනිවාර්ය නොවූ සාමාජිකත්වයෙන් ගොඩනැගී ඇත.
   (2) ස්වාධිපති බලය සහිත දේශපාලන ඒකකයක් වේ.
   (3) දණ්ඩනීය බලය පිළිබඳව ඒකාධිකාරය භුක්ති විඳී.
   (4) දණ්ඩනීය බලය ක්‍රියාවට නැංවීම පිළිබඳව සුජාතභාවය උරුම කරගෙන ඇත. (............)

www.alsapi.lk

7. රාජ්‍යයක ප්‍රධාන දේශපාලන සංකේත වන්නේ
(1) ජාතික ගීය
(2) ජාතික කොඩිය
(3) රාජ්‍ය මුද්‍රව
(4) ජාතික අගයන් (............)

8. නූතන රාජ්‍යයන්හි දේශපාලන බලයට පදනම් වී ඇත්තේ
(1) දේශපාලන ප්‍රභූන්ගේ බලයයි.
(2) ජනතාවගේ පොදු අභිමතයයි.
(3) ජනතාවගේ පොදු පිළිගැනීමයි.
(4) ජනතාව විසින් පිළිගත් සුජාතභාවයයි. (............)

9. ආණ්ඩුව
(1) සියලු ජනතාවගේ පොදු අභිමතය නියෝජනය කරයි.
(2) ප්‍රජාතන්ත්‍රවාදී හෝ ප්‍රජාතන්ත්‍රවාදී නොවිය හැක.
(3) එක් පුද්ගලයෙකුගෙන් හෝ පුද්ගල කණ්ඩායමකගෙන් සමන්විත වේ.
(4) රාජ්‍යයෙන් වියුක්තව වුවද පැවතිය හැක. (............)

10. ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාධ්‍යයන් වන්නේ
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
(2) සන්නද්ධ හමුදා සහ පොලීසියයි.
(3) බලතල බෙදීමයි.
(4) අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලයයි. (............)

- අංක 11 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ හතරෙන් තුනක් ප්‍රශ්නයේ මාතෘකාවට නොගැලපේ. එම වැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

11. රාජ්‍යය පිළිබඳ දේවවරම්වාදයට අනුව
(A) දෙවියන් වහන්සේ විසින් රාජ්‍යය මවා ඇත.
(B) රාජ්‍යය සමාජ සම්මුතියේ අවසාන ප්‍රතිඵලය වේ.
(C) රාජ්‍යය සිවිල් සමාජයට ද්විතීයික වේ.
(D) සිවිල් සමාජය තුළ රාජ්‍යය අභාවයට යන්නේ ය.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

12. රාජ්‍යය පිළිබඳ සමාජ සම්මුතිවාදයට අනුව
(A) පූර්ව - සිවිල් සමාජය තුළ පවා රාජ්‍යය පැවතිණ.
(B) රාජ්‍යය සමාජ සම්මුතියේ අවසාන ප්‍රතිඵලය වේ.
(C) රාජ්‍යය සිවිල් සමාජයට ද්විතීයික වේ.
(D) සිවිල් සමාජය තුළ අභාවයට යන්නේ ය.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

13. රාජ්‍යය පිළිබඳ විකාශනාත්මකවාදයට අනුව
(A) රාජ්‍යය අරගලයක ප්‍රතිඵලයකි.
(B) රාජ්‍යය ඇති සහ නැති පංති දෙකේ ගැටුමේ ප්‍රතිඵලයකි.
(C) රාජ්‍යය දේව කැමැත්තේ ප්‍රතිඵලයකි.
(D) රාජ්‍යය සමාජ විකාශන ක්‍රියාදාමයේ ප්‍රතිඵලයකි.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

14. රාජ්‍යය පිළිබඳ ලිබරල් න්‍යායට අනුව
(A) රාජ්‍යය ලෝක ධාතුවේ නිර්මාණයකි.
(B) රාජ්‍යය සමාජයේ දේපළ හිමි පංතියේ නිර්මාණයකි.
(C) රාජ්‍යය මිනිසුන්ගේ සමාජ හැසිරීමේ ස්වභාවික ප්‍රතිඵලයකි.
(D) රාජ්‍යය ජනතාව විසින් කෘත්‍රිමව නිර්මාණය කළ සංවිධානයකි.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

15. රාජ්‍යය පිළිබඳ සමාජවාදී න්‍යායට අනුව
(A) රාජ්‍යය පංති අසමගිතාවයේ ප්‍රතිඵලයකි.
(B) රාජ්‍යය සමාජය තුළ නීතිය හා සාමය පවත්වා ගෙන යාමට අවශ්‍ය වේ.
(C) රාජ්‍යය නිර්ධන පංතියේ සුභසාධනය වෙනුවෙන් වගකිව යුතුය.
(D) රාජ්‍යය නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ වියැකී යන්නේ ය.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

www.artsapi.lk

16. රාජ්‍යය පිළිබඳ පැසිස්ට් න්‍යායට අනුව
   (A) රාජ්‍යය පුද්ගලයින්ට හා සමාජයට වඩා උසස් වන්නේ ය.
   (B) රාජ්‍යය පුද්ගලයින්ට වඩා උසස් වුවද සමාජයට පහළින් තිබෙන දෙයක් වේ.
   (C) රාජ්‍යය පුද්ගලයින්ට මෙන්ම සමාජයට ද පහළින් පවතින්නක් වේ.
   (D) රාජ්‍යය පුද්ගලයින්ට හා සමාජයට ඉහළින් පවතින්නක් වුවද පල්ලියට පහළින් පවතී.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

17. සමාජය
   (A) දේශසීමාවන්ගෙන් බැඳී ඇත.
   (B) අනිවාර්ය සාමාජිකත්වය මත ගොඩනැගී ඇත.
   (C) රාජ්‍යයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූවක් වේ.
   (D) සංවිධානය වූ මිනිස් සමාජයක සියලුම මානව සංවිධානයන්ගේ සමස්තය වේ.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

18. බලතල බෙදීම යන්නෙන් අදහස් වන්නේ
   (A) සන්ධීය ආණ්ඩු ක්‍රමයක බලය බෙදීම පිළිබඳව ය.
   (B) ආණ්ඩුවේ බලතල බෙදීම පිළිබඳව ය.
   (C) දේශපාලන සහ ස්ථාවර විධායකයන් අතර විධායක බලය බෙදීම පිළිබඳව ය.
   (D) ඒකීය ආණ්ඩුක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පාලන අධිකාරයන් අතර බලය බෙදීම පිළිබඳව ය.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

19. බලය බෙදා හැරීම යනුවෙන් අදහස් වන්නේ
   (A) මධ්‍යම ආණ්ඩුවේ බලය පරිධිය වෙතට විමධ්‍යගත කිරීම ය.
   (B) රාජ්‍යයේ භෞමික අඛණ්ඩතාව බෙදා වෙන් කිරීම ය.
   (C) රාජ්‍යයේ දේශපාලන ස්වාධීනත්වය බෙදා වෙන් කිරීම ය.
   (D) රාජ්‍යයේ ස්වාධිපති බලය බෙදීම ය.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

20. රාජ්‍යයක ස්වාධිපති බලය මගින් සංකේතවත් වන්නේ
   (A) කුඩා රාජ්‍යයන් ඉක්මවා ගිය විශාල රාජ්‍යයන්ගේ උත්තරීතරත්වයයි.
   (B) අභ්‍යන්තර කටයුතු පිළිබඳව රාජ්‍යයේ උත්තරීතරත්වයයි.
   (C) බාහිර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍යයේ උත්තරීතරත්වයයි.
   (D) අභ්‍යන්තර සහ බාහිර කටයුතු පිළිබඳව රාජ්‍යයේ උත්තරීතරත්වයයි.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

- අංක 21 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ වන්නේ ප්‍රකාශ තුනක් පමණි. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

21. පළාත් ආණ්ඩුක්‍රමය
   (A) ආණ්ඩුකරණයට ජනතා සහභාගීත්වය වැඩි කරයි.
   (B) ප්‍රාදේශීය කටයුතු සඳහා මධ්‍යම ආණ්ඩුව මත රඳා පැවතීම අඩු කරයි.
   (C) ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරයි.
   (D) ප්‍රාදේශීය මට්ටමෙන් පවුල් පෙලපත් වර්ධනය වීමට උපකාර කරයි.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

22. නීතිය
   (A) අණදීම් සහ මෙහෙයුම් ස්වරූපයෙන් ප්‍රකාශ කරන රාජ්‍ය කැමැත්ත වේ.
   (B) ස්වාධිපති බලය පදනම් කරගෙන රාජ්‍යය විසින් පනවනු ලැබේ.
   (C) සදාචාරාත්මක මූලධර්ම සමඟ සමපාත විය යුතුය.
   (D) නීති කඩකරන අයට දඬුවම් කිරීමේ බලය සහිතව උසාවි හරහා ක්‍රියාත්මක කරයි.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   (A) මුළුමනින්ම ලියන ලද හෝ නොලියන ලද නීතිමය ලියවිල්ලක් වේ.
   (B) රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳ මූලික නීති අඩංගු ලියවිල්ල වේ.
   (C) ආණ්ඩුව සහ එහි කාර්යයන්ට සුජාතභාවය සපයන ලියවිල්ල වේ.
   (D) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික පදනම වේ.
   (1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

www.artsapi.lk

24. ව්‍යවස්ථාදායක
(A) එක් මණ්ඩලයකින් හෝ මණ්ඩල දෙකකින් සමන්විත විය හැක.
(B) නීති පැනවීම කරනු ලබයි.
(C) රාජ්‍ය මූල්‍යය පාලනය කරයි.
(D) දේශපාලන විධායකයේ අධීක්ෂණයට යටත්ව ක්‍රියාත්මක වේ.
(1) ABC (2) ABD (3) ACD (4) BCD

25. විධායකය
(A) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කරයි.
(B) රාජ්‍ය වැඩ කටයුතු සම්බන්ධීකරණය කරයි.
(C) නීතිය අර්ථකථනය කරයි.
(D) ස්ථිර විධායකය, සන්නද්ධ සේවාවන් හා පොලිසිය පාලනය කරයි.
(1) ABC (2) ABD (3) ACD (4) BCD

26. අධිකරණය
(A) යුක්තිය පසිඳලයි
(B) නීති අර්ථකථනය කරයි.
(C) නීති අර්ථකථනය කිරීම හරහා නව නීති සම්පාදනය කරයි.
(D) යල්පැනගිය නීති නිෂේධනය කරයි
(1) ABC (2) ABD (3) ACD (4) BCD

27. දේශපාලන සමාජානුයෝජනය
(A) මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ක්‍රියාදාමය වේ.
(B) මිනිසුන් දේශපාලන සමාජයට හුරුපුරුදු කරන ක්‍රියාදාමය වේ.
(C) මිනිසුන් දේශපාලන ප්‍රාගුණ්‍යයන් වර්ධනය කර ගන්නා ක්‍රියාදාමය වේ.
(D) දේශපාලනයේ දූෂිත භාවිතයන් මිනිසුන් ඉගෙන ගන්නා ක්‍රියාදාමය වේ.
(1) ABC (2) ABD (3) ACD (4) BCD

28 දේශපාලන පක්ෂ
(A) දේශපාලන ක්‍රීඩාවේ නියැලේ
(B) පෞද්ගලික ආශාවන් වර්ධනය කරයි
(C) දේශපාලන හා ආර්ථික මතවාදය අනුව එකිනෙකින් වෙනස් වේ.
(D) මිනිසුන් දේශපාලන වශයෙන් දැනුවත් කරයි.
(1) ABC (2) ABD (3) ACD (4) BCD

29. බලපෑම් කණ්ඩායමේ
(A) පෞද්ගලික ආශාවන් වර්ධනය කිරීම අරමුණ කරගනී.
(B) බල අරගලයේ නියුක්ත වේ.
(C) පොදු කරුණු ගැන ජනතා හදගැස්ම පිළිබඳව අවදියෙන් සිටී.
(D) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු සපයනු ලැබේ.
(1) ABC (2) ABD (3) ACD (4) BCD

30. මහජන මතය
(A) පොදු කරුණු ගැන ජනතාව තම මතය ප්‍රකාශ කරන මාධ්‍යය වේ.
(B) ආණ්ඩුවේ ජනප්‍රියභාවය මැනීමට යොදා ගතහැකි මාධ්‍යයක් වේ.
(C) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව ජනතා ප්‍රතිචාරය මැනීමට යොදා ගතහැකි මාධ්‍යයක් වේ.
(D) ජනතා මනස පාලනය කිරීමට ආණ්ඩුවට භාවිතයට ගතහැකි මාධ්‍යයක් වේ.
(1) ABC (2) ABD (3) ACD (4) BCD

www.alsapi.lk

● අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) යන කවර හැඳින්වීම දැ'යි සඳහන් කරන්න.

**අංක 1 වගුව සඳහා යොමුව**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| (1) | සත්‍ය ය. | සත්‍ය ය. |
| (2) | සත්‍ය ය. | අසත්‍ය ය. |
| (3) | අසත්‍ය ය. | සත්‍ය ය. |
| (4) | අසත්‍ය ය. | අසත්‍ය ය. |

**වගුව 1**

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 31. | ඇමරිකා එක්සත් ජනපදයේ සෙනෙට් මණ්ඩලය ලෝකයේ ප්‍රබලම දෙවන මණ්ඩලය ලෙස සලකනු ලැබේ. | අධිකරණ විවරණ බලය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය දෙන තීරණ අහෝසි කිරීමේ බලය සෙනෙට් මණ්ඩලය සතුව ඇත. (............) |
| 32. | ප්‍රාන්ත රාජ්‍යයන් පනහකට වඩා වැඩි සංඛ්‍යාවකින් සමන්විත ඇමරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් වේ. | වසරක පූර්ව දැනුම් දීමකින් අනතුරුව සන්ධීය ක්‍රමයෙන් ඉවත් වීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාන්ත රාජ්‍යයන්ට සහතික කර ඇත. (............) |
| 33. | කිරීටය, අගමැති සහ කැබිනට් මණ්ඩලය, මණ්ඩල දෙකකින් සමන්විත ව්‍යවස්ථාදායකය යන ආයතන තුනෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය සමන්විත වේ. | කිරීටය නාමික විධායකය වන අතර එය ක්‍රියාත්මක විය යුත්තේ සත්‍ය විධායකයේ උපදෙස් සහ කැමැත්ත පරිදි ය. (............) |
| 34. | බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ සාමි මන්ත්‍රී මණ්ඩලය දෙවන මණ්ඩලය ලෙස සැලකෙන අතර ව්‍යවස්ථා සම්පාදනය හා මුදල් කටයුතු පාලනය සම්බන්ධයෙන් එයට හිමිව ඇත්තේ සීමිත බලයකි. | සාමි මන්ත්‍රී මණ්ඩලය සාමාන්‍ය පනත් වසරකින් ප්‍රමාද කළ හැකි අතර මුදල් පනත් සංශෝධනය කළ හැක. (............) |
| 35. | 1958 දී ප්‍රංශය තුළ ස්ථාපිත කල පස්වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයා, අගමැති සහ කැබිනට් මණ්ඩලය යන ද්විත්ව විධායක මට්ටම් දෙකක් සහිත දෙමුහුන් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දුන්නේය. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කිරීම, රාජ්‍ය බලය නිසි අයුරින් ක්‍රියාවට නැංවීම, රාජ්‍යයේ අඛණ්ඩ පැවැත්ම, ජාතික නිදහස හා දේශසීමා ඒකාග්‍රතාව යන කරුණු සහතික කොට පවත්වා ගෙනයාම සහ අන්තර්ජාතික ගිවිසුම් වලට ගරුකිරීම යන කාර්යයන් ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට පවරා ඇත. (............) |
| 36. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ප්‍රංශයේ ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝග ඉදිරිපත් කළ නොහැක. | ප්‍රංශයේ ජනාධිපතිවරයා තනතුරින් ඉවත් කළ හැක්කේ ජනමත විචාරණයක දී ජනතාව තීරණය කරන්නේ නම් පමණි. (............) |
| 37. | පාර්ලිමේන්තුව විසින් නාමකරණයෙන් පත්කළ සාමාජිකයන්ගෙන් සමන්විත ඡන්ද විද්‍යාලයක් මගින් ඉන්දියාවේ ජනාධිපතිවරයා තෝරා පත්කරනු ලැබේ. | ඉන්දියාවේ ජනාධිපතිවරයා නාමික විධායකය වන අතර ඔහුට හෝ ඇයට ක්‍රියාත්මක විය හැක්කේ දේශපාලන විධායකයේ උපදෙස් හා කැමැත්ත අනුවය (............) |
| 38. | ඉන්දියාවේ පාර්ලිමේන්තුව ද්වි මාණ්ඩලික වන අතර ලෝක් සභාව සහ රාජ්‍ය සභාව ලෙස එම මණ්ඩල දෙක හැඳින්වේ. | මණ්ඩල දෙක අතුරින් රාජ්‍ය සභාව පළමු මණ්ඩලය ලෙස හැඳින්වෙන අතර එය වඩාත්ම බලවත් මණ්ඩලය වේ. (............) |
| 39. | කලින් පැවති සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය තුළ කොමියුනිස්ට් පාලනය යටතේ පැවතියේ කොමියුනිස්ට් පක්ෂය නමින් හැඳින්වුණු එක් දේශපාලන පක්ෂයක් පමණි. | කොමියුනිස්ට් පක්ෂය රාජ්‍යය වූ අතර රාජ්‍යය කොමියුනිස්ට් පක්ෂය විය. (............) |
| 40. | පෙරස්ට්‍රොයිකා සහ ග්ලාස්නොට් යන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කලින් පැවති සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය බිඳ වැටුණේය. | සෝවියට් සංගමයේ බිඳ වැටීම මගින් මාක්ස් ලෙනින් වාදය යටතේ පිහිට වූ පළමු කොමියුනිස්ට් ආණ්ඩුක්‍රමයේ අවසානය සනිටුහන් කළේය. (............) |

www.artsedu.lk

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

## 2009 අගෝස්තු

**දේශපාලන විද්‍යාවේ මූලිකාංග - I - II කොටස**

**පැය තුනයි**

අයදුම්කරුවන්ට උපදෙස්:

* ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 15කි.
* ප්‍රශ්න කොටස්වලට බෙදා ඇති විට ලකුණු කොටස් අතර සමාන ව බෙදේ.

1. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර වෙනස විස්තර කරන්න.

2. පහත දැක්වෙන ඒවායේ මූලික ලක්ෂණ දක්වන්න.
   (i) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු
   (ii) සමාජවාදී ආණ්ඩු
   (iii) පැසිස්ට් ආණ්ඩු

3. පහත දැක්වෙන ඒවා සාකච්ඡා කරන්න.
   (i) ස්වාධිපති බලය
   (ii) බලතල බෙදීම
   (iii) නීතියේ ආධිපත්‍යය

4. පහත දැක්වෙන ඒවා විභාග කරන්න
   (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ සෙනෙට් මණ්ඩලය
   (ii) ඉන්දියානු ආණ්ඩුක්‍රමය තුළ රාජ්‍ය සභාව
   (iii) මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව

5. පාර්ලිමේන්තු සහ ජනාධිපති ආණ්ඩුක්‍රමවල ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

6. පහත දැක්වෙන ඒවා විස්තර කරන්න
   (i) ජනමත විචාරණය
   (ii) ප්‍රාරම්භනය
   (iii) යළි කැඳවීම

7. පහත දැක්වෙන ඒවායින් ඕනෑ ම තුනක් ගැන කෙටි සටහන් ලියන්න.
   (i) පෙර පැවති සෝවියට් සමූහාණ්ඩුවේ කොමියුනිස්ට් පක්ෂය
   (ii) සමානුපාතික නියෝජන ක්‍රමයේ මූලික ලක්ෂණ
   (iii) මානව අයිතිවාසිකම්
   (iv) මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය
   (v) දේශපාලන සංස්කෘතිය

### 2. (i) මූලික ලක්ෂණ - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු

ප්‍රජාතන්ත්‍රවාදය අර්ථාන්විත වීමට නම් එවැනි සමාජයක් තුළ මූලික ලක්ෂණ කිහිපයක් තිබිය යුතු බව සුප්‍රකට දේශපාලන විද්‍යා විශාරදයන් කීපදෙනෙකු විසින් පවසා ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ තිබිය යුතු මූලික ලක්ෂණයක් නම් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අර්ථ කථනය කර ඇත්තේ බහුතරයේ කැමැත්ත මත ප්‍රජාතන්ත්‍රවාදී සිද්ධාන්ත මූලික කොටගෙන රට පාලනය කිරීමයි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළ ප්‍රධාන ආයතන දෙකක් ඇත. එනම් ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය යි. ඡන්ද කොට්ඨාශ අනුව සාධාරණ හා නිදහස් මැතිවරණයකින් බහුතර කැමැත්ත ලබාගන්නා පිරිසට රට පාලනය කිරීමේ වගකීම පැවරෙන අතර ව්‍යවස්ථාදායකයේ සුළුතරය විරුද්ධ පක්ෂය වේ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ මෙම ආයතන දෙකට

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
## 2009 අගෝස්තු

**පැය තුනයි**

**දේශපාලන විද්‍යාවේ මූලිකාංග - II**

අයදුම්කරුවන්ට උපදෙස්:

* I කොටසේ බහුවරණ ප්‍රශ්න 40ක් ඇත.
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. එක් නිවැරදි පිළිතුරකට ලකුණු එක බැගින් හිමි වේ.
* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා, එය II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දිය යුතු ය.
* එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.
* පිළිතුරු ලකුණු කිරීම සඳහා පැන්සල් භාවිත කිරීම තහනම් වේ.

## I කොටස

● අංක 1 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් එක් ප්‍රකාශයක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ නොවේ. අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

1. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ලංකාවට
   (1) වෙළඳපොළ ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
   (2) රෝම - ලන්දේසි නීති ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
   (3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හඳුන්වා දුන්නේ ය.
   (4) බටහිර අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දුන්නේ ය. (............)

2. 1802 අධිකාරී බලපත්‍රය මගින්
   (1) බ්‍රිතාන්‍ය මුහුදුබඩ ප්‍රදේශ යටත්විජිත තත්ත්වයට පත් කළේ ය.
   (2) විධායක හා ව්‍යවස්ථාදායක බලතල සහිත ආණ්ඩුකාරයකු පත් කළේ ය.
   (3) ආණ්ඩුකාරයා අධීක්ෂණය කිරීමේ බලය බ්‍රිතාන්‍ය ඉන්දීය පෙරදිග වෙළඳ සමාගමට පැවරී ය.
   (4) ආණ්ඩුකාරයාට සහායවීමට උපදේශක සභාවක් පත් කළේ ය. (............)

3. කෝල්බෲක් කොමිසමේ යෝජනා මගින් නිර්දේශ කළේ
   (1) වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම ය.
   (2) තනි අධිකාරියක් යටතේ පාලන බලතල ඒකරාශී කිරීම ය.
   (3) ලාංකිකයන්ට රාජ්‍ය සේවයට ඇතුල්වීමට අවසර දීම ය.
   (4) පැවති ද්විත්ව පරිපාලන ක්‍රමය තවදුරටත් පවත්වා ගෙනයාම ය. (............)

4. 1833 දී රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.
   (1) ලංකාව තුළ වෘත්තිය සමිති ව්‍යාපාරය ආරම්භ වීම සනිටුහන් කළේ ය.
   (2) ලංකාව තුළ වැඩවසම් සේවා භුක්ති ක්‍රමයේ අවසානය සනිටුහන් කළේ ය.
   (3) ලංකාව තුළ නිදහස් ශ්‍රම වෙළඳපොළ ආරම්භවීම සනිටුහන් කළේ ය.
   (4) ලංකාව තුළ යටත් විජිත රාජ්‍යයක් පිහිටුවීම සනිටුහන් කළේ ය. (............)

5. 1833 දී අඩරට හා මුහුදුබඩ පළාත් ඒකාබද්ධ කිරීම හේතු කොටගෙන
   (1) ඒකීය ආණ්ඩු පාලනයක් හඳුන්වා දියහැකි විය.
   (2) ඒකීය පරිපාලන ක්‍රමයක් හඳුන්වා දියහැකි විය.
   (3) ඒකීය අධිකරණ ක්‍රමයක් හඳුන්වා දියහැකි විය.
   (4) ඒකීය නීති ක්‍රමයක් හඳුන්වා දියහැකි විය. (............)

6. 1833 දී ස්ථාපිත කළ විධායක සභාව
   (1) ආණ්ඩුකරුට සහායවීමේ උපදේශක සභාවක් විය.
   (2) ආණ්ඩුකරුට උපදෙස් දිය යුතු වූයේ පරිපාලන කාර්යයන් පිළිබඳව පමණි.
   (3) ආණ්ඩුකරු සහ තවත් රාජ්‍ය නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත විය.
   (4) ආණ්ඩුකරුගේ ප්‍රධානත්වයෙන් රැස්විය. (............)

www.artsapi.lk

7. 1833 ස්ථාපිත කළ ව්‍යවස්ථාදායක සභාව
(1) සාමාජිකයින් 15 කින් සමන්විත විය.
(2) පණත් සම්මත කිරීමේ බලය භුක්ති වින්දේ ය.
(3) ව්‍යවස්ථාදායක කාර්යයන් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය කිරීටයට සාමූහිකව වගකිව යුතු විය.
(4) බ්‍රිතාන්‍ය කිරීටයේ සහ ආණ්ඩුකරුගේ බලයට යටත්ව ක්‍රියාත්මක විය. (............)

8. 1910 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(1) ලාංකික නායකයින්ගේ ඉල්ලීම්වලට දක්වන ලද ප්‍රතිචාරයක් විය.
(2) සාමාජිකයින් 21 කින් සමන්විත ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවී ය.
(3) සීමිත ඡන්ද බලයක් හඳුන්වා දුන්නේ ය.
(4) සුදුසුකම්ලත් ඡන්දදායකයින්ට මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත්කිරීමේ බලය පැවරුවේ ය. (............)

9. ලංකාවේ ජාතික ව්‍යාපාරය
(1) රැඩිකල් ජාතික විමුක්ති ව්‍යාපාරයක් විය.
(2) ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් විය.
(3) වගකීම් සහිත පාලන ක්‍රමයක් ලබාගැනීමේ අරමුණු කරගත් ව්‍යාපාරයක් විය.
(4) සමාජයේ බටහිරකරණයට ලක් වූ සමාජ ප්‍රභූන්ගේ ව්‍යාපාරයක් විය. (............)

10. 1924 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය
(1) බලය සහ වගකීම් එකිනෙකින් වෙන් කරන ලද ආණ්ඩුක්‍රමයක් පිහිටුවී ය.
(2) වාර්ගික නියෝජනය අහෝසි කළේ ය.
(3) ඡන්දයෙන් පත් වූ නිල නොලත් මන්ත්‍රීවරුන් ව්‍යවස්ථාදායක සභාවේ බහුතරය බවට පත් කළේ ය.
(4) සියලු නිල නොලත් මන්ත්‍රීවරු මුදල් කාරක සභාවේ සාමාජිකයන් බවට පත් කළේ ය. (............)

● අංක 11 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ හතරෙන් මාතෘකාවට අනුව නිවැරදි වන්නේ එක් ප්‍රකාශයක් පමණි. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

11. 1930 ගණන් වල ආරම්භ වූ ලංකාවේ වාමාංශික ව්‍යාපාරය
(1) මධ්‍යම පංතික රැඩිකල් තරුණ කණ්ඩායමක් විසින් ආරම්භ කරන ලදී.
(2) ජාතික නිදහස සඳහා ලංකා ජාතික සංගමය සමඟ එක්ව කටයුතු කළේ ය.
(3) ග්‍රාමීය ගොවි ජනතාව සංවිධානය කිරීමේ නියුක්ත විය.
(4) ලිබරල් සමාජවාදී රාජ්‍යයක් පිහිටුවීමේ අභිප්‍රායෙන් ක්‍රියා කළේ ය. (............)

12. ඩොනමෝර් කොමිසම යෝජනා කළේ
(1) ද්විත්ව විධායකයක් සහිත ආණ්ඩුක්‍රමයක් පිහිටුවීමට ය.
(2) විධායක හා ව්‍යවස්ථාදායක කාර්යයන් ඉටුකරන ව්‍යවස්ථාදායකයක් පිහිටුවීමට ය.
(3) ලාංකිකයින්ගෙන් පමණක් සමන්විත අමාත්‍ය මණ්ඩලයක් පිහිටුවීමට ය.
(4) සුළුතර ජන කොටස් සඳහා දෙවන මණ්ඩලයක් පිහිටුවීමට ය. (............)

13. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ පදනම වූයේ
(1) විධායක බලතල ක්‍රියාවට නැංවීමේ හවුල්කාරීත්වයයි.
(2) ලාංකිකයින්ට සියළු ව්‍යවස්ථාදායක බලතල පැවරීමයි.
(3) ආණ්ඩුකාරයා අත සියලු විධායක බලතල රැඳවීමයි.
(4) සියලු විධායක හා ව්‍යවස්ථාදායක බලතල ලාංකිකයින්ට පැවරීමයි. (............)

14. ඩොනමෝර් අමාත්‍ය මණ්ඩලයේ ලාංකික සාමාජිකයින් පත් කරනු ලැබූයේ
(1) විධායක කාරක සභා විසිනි.
(2) විධායක කාරක සභා විසින් නම් කරන ලදුව ආණ්ඩුකාරයා විසිනි.
(3) බ්‍රිතාන්‍ය කිරීටය විසිනි.
(4) යටත් විජිත ලේකම් විසිනි. (............)

15. ඩොනමෝර් ක්‍රමය යටතේ ස්ථාපිත කළ රාජ්‍ය මන්ත්‍රණ සභාව
(1) ඡන්දයෙන් තෝරන, නාමකරණයෙන් පත්කළ සහ නිලබලයෙන් පත් වූ සාමාජිකයින්ගෙන් සමන්විත විය.
(2) ව්‍යවස්ථාදායක බලතල පමණක් භුක්ති වින්දේ ය.
(3) නියමිත නිල කාලයට පෙර විසුරුවා හැරිය හැකි විය.
(4) ස්වදේශ කටයුතු භාර ඇමති නිල බලයෙන් ම මුලසුන දැරී ය. (............)

www.artsapi.lk

16. සොල්බරි කොමිසම යෝජනා කළේ
(1) විධායක කාරක සභා ක්‍රමය පදනම් කරගත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමක් පිහිටුවීමට ය.
(2) ආණ්ඩුකාරවරයකුගේ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් පිහිටුවීම ය.
(3) වෙස්ට්මින්ස්ටර් ආකෘතිය පදනම් කරගත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් පිහිටුවීමට ය.
(4) අගමැතිවරයකුගේ නායකත්වයෙන් යුත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් පිහිටුවීමට ය. (............)

17. සොල්බරි ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයා
(1) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය නියෝජනය කළේ ය.
(2) සය අවුරුදු කාලයක් නිලය දැරී ය.
(3) දෙවන මණ්ඩලය විසුරුවා හැරීමේ බලය භුක්ති වින්දේ ය.
(4) පත්කරනු ලැබූයේ බ්‍රිතාන්‍ය කිරීටය විසිනි. (............)

18. සොල්බරි ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය
(1) ඒක මාණ්ඩලික විය.
(2) හැඳින්වූණේ රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙස ය.
(3) සමන්විත වූයේ ඡන්දයෙන් පත්කළ සාමාජිකයින්ගෙන් පමණි.
(4) නීති සම්පාදනය සම්බන්ධයෙන් ස්වාධිපති බලය භුක්ති නොවින්දේ ය. (............)

19. සොල්බරි ව්‍යවස්ථාව යටතේ අගමැතිවරයා
(1) පත්කරනු ලැබූයේ පාර්ලිමේන්තුව විසිනි.
(2) රාජ්‍ය නායකයා විය.
(3) සත්‍ය විධායකයේ නායකයා විය.
(4) දෙවන මණ්ඩලයට වගකිව යුතු විය. (............)

20. සොල්බරි ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලය
(1) සමන්විත වූයේ පළමු මණ්ඩලයේ සමාජිකයන්ගෙන් පමණි.
(2) පත්කරනු ලැබූයේ අගමැති විසිනි.
(3) පාර්ලිමේන්තුවට සාමුහිකව වගකිව යුතු විය.
(4) දෝෂාභියෝගයක් මගින් ඉවත් කළ හැකි විය. (............)

- අංක 21 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ තුනක් පමණි. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

21. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - රාජ්‍යයේ නිල නාමය වෙනස් කළේ ය.
B - මහා බ්‍රිතාන්‍ය සමඟ මෙතෙක් පැවති ව්‍යවස්ථා සබඳතා සියල්ල අත්හැරියේ ය.
C - සිංහල සහ බුද්ධාගම රාජ්‍ය භාෂාව හා රාජ්‍ය ආගම තත්ත්වයට පත් කළේ ය.
D - ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී සහ ස්වාධීන රාජ්‍යයක් බව ප්‍රකාශයට පත් කළේ ය.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

22. 1972 ව්‍යවස්ථාවේ පදනම් මූලධර්ම වූයේ
A - බලතල බෙදීමේ න්‍යායයි.
B - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යායයි.
C - ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී න්‍යායයි.
D - මහජන ස්වාධිපතිත්වය පිළිබඳ න්‍යායයි.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

23. 1972 ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ජාතික රාජ්‍ය සභාව
A - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණ විය.
B - විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල හිමි කරගෙන සිටියේ ය.
C - පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය පිළිබඳ මූලධර්මය පදනම් කරගෙන පිහිටුවා තිබුණි.
D - සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවති පාර්ලිමේන්තුවේ කාබන් කොපියක් විය.
(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

www.artsapi.lk

24. 1972 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයා
A - පත් කරනු ලැබූයේ අගමැතිවරයා විසිනි.
B - රාජ්‍යයේ නායකයා විය.
C - පනත් අනුමත කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය භුක්ති වින්දේ ය.
D - බලතල හා කාර්යයන් අතින් බලවත් තනතුරක් නොවීය.

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

25. 1972 ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම්
A - පරිපථය සීමිත විය.
B - ජීවිතයට ඇති අයිතිය පිළිගත්තේ ය.
C - නීතිමය රැකවරණය මගින් සුරක්ෂිත කරන ලදී.
D - භුක්ති විඳීමට සිදුවූයේ විවිධ නීතිමය සීමාවන්ට යටත්ව ය.

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

26. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කළේ ය.
B - ආණ්ඩුවේ මෙහෙයවීම හා පාලනය භාරව කැබිනට් මණ්ඩලයක් පත් කළේ ය.
C - පාර්ලිමේන්තු ස්වාධිපතිත්වය පදනම් කරගත් ව්‍යවස්ථාදායකයක් ගොඩනැගිය.
D - ශ්‍රේෂ්ඨාධිකරණය ඉහළ උසාවිය වන පරිදි අධිකරණයක් පිහිටුවිය.

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

27. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා
A - සය අවුරුදු නිල කාලයක් සඳහා ජනතාව විසින් පත්කරනු ලැබේ.
B - ධූරය දැරිය හැක්කේ වාර දෙකක් පමණි.
C - ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය ක්‍රියාවට නංවනු ලැබේ.
D - පාර්ලිමේන්තුවට වග කියනු නොලැබේ.

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

28. 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව
A - සමන්විත වන්නේ මන්ත්‍රීවරු 225 කිනි.
B - ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නැංවීමේ තනි සහ අනන්‍ය බලය භුක්ති විඳී.
C - අභ්‍යන්තර වැඩ කටයුතු ස්ථාවර නියෝග අනුව කරනු ලැබේ.
D - වසරකට අඩුම වශයෙන් දෙවරක් රැස්විය යුතු ය.

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

29. 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය
A - අවසාන හා උත්තරීතර ලේඛණෝපගත අධිකරණය වේ.
B - ව්‍යවස්ථා කටයුතු සහ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් තනි හා අනන්‍ය අධිකරණ බලය භුක්ති විඳී.
C - අභ්‍යන්තර වැඩ කටයුතු ස්ථාවර නියෝග අනුව කරනු ලැබේ.
D - සමන්විත වන්නේ අග විනිසුරු ඇතුළු විනිශ්චයකරුවන් දස දෙනෙකුගෙනි.

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

30. 1978 ව්‍යවස්ථාව යටතේ පිහිට වූ නව රාජ්‍ය ආයතන වන්නේ
A - පුවත්පත් මණ්ඩලය
B - ජාතික පොලිස් කොමිසම
C - ඔම්බුඩ්ස්මන්
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

(1) ABC (2) ABD (3) ACD (4) BCD (............)

www.arsap.lk

● අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) යන කවර හැඳින්වීම දැයි සඳහන් කරන්න.

අංක 1 වගුව සඳහා යොමුව

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| (1) | සත්‍ය ය. | සත්‍ය ය. |
| (2) | සත්‍ය ය. | අසත්‍ය ය. |
| (3) | අසත්‍ය ය. | සත්‍ය ය. |
| (4) | අසත්‍ය ය. | අසත්‍ය ය. |

වගුව I

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 31. | බහුපක්ෂ ක්‍රමය ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණය වේ. | දේශපාලන පක්ෂ ක්‍රමයේ නායකත්වය ප්‍රධාන පක්ෂ දෙකක් විසින් දරනු ලැබේ. (...........) |
| 32. | 1987 ඉදිරිපත් කළ 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ලැයිස්තු තුනක් මත පදනම් වූ ආණ්ඩු බලය බෙදා හැරීමේ ක්‍රමයක් හඳුන්වා දුන්නේ ය. | තුන්වන ලැයිස්තුව හෙවත් සමගාමී ලැයිස්තුව තුළ විෂය කරුණු 36 ක් අන්තර්ගත වන අතර ඒ සම්බන්ධයෙන් ප්‍රඥප්ති පැනවීමට පළාත් සභාවලට තනි සහ අනන්‍ය බලය හිමි වේ. (...........) |
| 33. | ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය සමන්විත වන්නේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන තුන් ආකාර ආයතන පද්ධතියෙනි. | නගර සභා සහ ප්‍රාදේශීය සභා අධීක්ෂණය කිරීමේ බලය මහ නගර සභාවන්ට හිමිව ඇත. (...........) |
| 34. | ජනාධිපතිවරයාගේ විධායක බලතල ශක්තිමත් කිරීමේ අරමුණ සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය ගෙන එන ලදී. | 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පිහිටුවන ලදී. (...........) |
| 35. | 1948-1956 කාලය තුළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු යටතේ අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ වූයේ "බටහිර ගැති" සහ "කොමියුනිස්ට් විරෝධී" ආකල්පයයි. | 1956 දී බලයට පැමිණි එස්. ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායක විසින් සියළු රටවල් සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වීමේ ප්‍රතිපත්තිය සහ නොබැඳි පිළිවෙත හඳුන්වා දුන්නේ ය. (...........) |
| 36. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලික අරමුණ වන්නේ ලෝක සාමය සුරක්ෂිතව ස්ථාපිත කොට පවත්වා ගෙන යාමයි. | මූලික අරමුණ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ලබා ඇති ප්‍රගතිය සීමාසහිත වුවද, තවත් ලෝක යුද්ධයක් ඇතිවීම වලක්වාලීම සම්බන්ධයෙන් එය සාර්ථක වී ඇත. (...........) |
| 37. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය ස්ථාවර සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සහ තාවකාලික සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත වේ. | තාවකාලික සාමාජිකයින් අටදෙනා පස් අවුරුදු නිල කාලයක් සඳහා මහ ලේකම්වරයා විසින් පත්කරනු ලැබේ. (...........) |
| 38. | 1945 බ්‍රිටන් වුඩ්ස් ගිවිසුම යටතේ ප්‍රතිනිර්මාණය සහ සංවර්ධනය පිළිබඳ අන්තර් ජාතික බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටවනු ලැබිය. | මෙම ආයතන දෙක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂිත ආයතන වුවද ඒවා ක්‍රියාත්මක වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීම් වලින් තොරව ස්වාධීන ආයතන ලෙස ය. (...........) |
| 39. | ආර්ථික, සමාජීය සහ සංස්කෘතික යන ක්ෂේත්‍ර තුළ කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් 1984 දී කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානය පිහිටුවන ලදී. | සාක් සංවිධානයේ තීරණ ගැනීමේ ආයතන ධූරාවලියේ ඉහළම සංවිධානය වන්නේ වාර්ෂිකව පවත්වන විදේශ අමාත්‍යවරුන්ගේ සමුළුව වේ. (...........) |
| 40. | බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය නිදහස් රාජ්‍යයන්ගේ එකතුවක් වන අතර ඒවා කලින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිත විය. | බ්‍රිතාන්‍යය පොදු රාජ්‍ය මණ්ඩලය අධි ජාතිකත්ව අන්තර්ජාතික සංවිධානයක් හෝ රාජ්‍ය සංගමයක් නොවන අතර විධායක බලතල සහිත ආණ්ඩුවක් ද නොවන්නේ ය. (...........) |

www.ortsapi.lk

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

## 2009 අගෝස්තු

**දේශපාලන විද්‍යාවේ මූලිකාංග - II - II කොටස** **පැය තුනයි**

අයදුම්කරුවන්ට උපදෙස්:

* ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 15කි.
* ප්‍රශ්න කොටස්වලට බෙදා ඇති විට ලකුණු කොටස් අතර සමාන ව බෙදේ.

1. පහත දැක්වෙන ඒවා සාකච්ඡා කරන්න.
   (i) ආගමික පුනර්ජීවන ව්‍යාපාර
   (ii) ජාතික ව්‍යාපාරය
   (iii) වාමාංශික ව්‍යාපාරය

2. 1931 දී ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමේ සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල විශ්ලේෂණය කරන්න.

3. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පහත දැක්වෙන ඒවායේ ක්‍රියාකාරීත්වය විස්තර කරන්න
   (i) රාජ්‍ය නිලධාරීන්
   (ii) විධායක කාරක සභා ක්‍රමය
   (iii) පෞද්ගලික මන්ත්‍රීවරයා

4. සොල්බරි හා පළමු ජනරජ ව්‍යවස්ථාවන් යටතේ පැවති ව්‍යවස්ථාදායකයන් පහත දැක්වෙන මාතෘකා යටතේ සංසන්දනය කරන්න.
   (i) සංයුතිය
   (ii) ව්‍යවස්ථාදායක බලතල
   (iii) ව්‍යවස්ථාදායක පිළිබඳ අධිකරණ විවරණය

5. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා හා සම්බන්ධව පහත දැක්වෙන ඒවා සාකච්ඡා කරන්න.
   (i) ජනාධිපති හා කැබිනට් මණ්ඩලය
   (ii) ජනාධිපති හා පාර්ලිමේන්තුව
   (iii) ජනාධිපති හා රාජ්‍ය සේවාව

6. 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය හා සම්බන්ධව පහත දැක්වෙන ඒවා විභාග කරන්න.
   (i) සංයුතිය හා එහි සාමාජික විනිශ්චයකාරවරුන් පත් කරන ආකාරය
   (ii) බලතල හා කාර්යයන්
   (iii) විනිශ්චයකරුවන් තනතුරින් ඉවත් කරන ආකාරය

7. පහත දැක්වෙන ඒවායින් ඕනෑ ම තුනක් ගැන කෙටි සටහන් ලියන්න.
   (i) 13 වන ව්‍යවස්ථා සංශෝධනය (1987)
   (ii) 17 වන ව්‍යවස්ථා සංශෝධනය (2001)
   (iii) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම
   (iv) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලධර්ම සහ අරමුණු
   (v) සාක් සංවිධානයේ මූලධර්ම සහ අරමුණු

www.artsapi.lk